# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2451/19 - 2025 අගෝස්තු මස 27 වැනි බදාදා - 2025.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 6/2017

**2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත**

9 වන වගන්තිය යටතේ වන නියමය

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 9 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය බිමල් නිරෝෂන් රත්නායක වන මම, මේ නියමය මගින්, අංක 2050/38 දරන සහ 2017 දෙසැම්බර් මස 21 වන දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනය, එහි "ගගන නාවික පහසුකම් සහ ගගන යාත්‍රාංගනවලට ආබද්ධ ඉඩම් (තුන්වන උපලේඛනයේ නිශ්චය කොට ඇති)" යන ශීර්ෂය යටතේ පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි:-

*(අ)* එහි 5 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"5. පිදුරුතලාගල කන්දේ පිහිටුවා ඇති රේඩාර් ස්ථානය, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම, එනම්-

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ මතුරට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 512B මන්දාරම්නුවර ග්‍රාම නිළධාරී වසමේ පිහිටි, සර්වේයර් ජනරාල්වරයා විසින් සාදන ලද අංක 330489 දරන සහ 2024.11.27 වන දිනැති කැඩැස්තර සිතියම මගින් බෙදා වෙන්කළ කලාප අංක 02 හි කැබලි අංක 01 ලෙස නිරූපිත උතුරට මු.පි.නු. 2308 හි කැබලි අංක 33 ද, නැගෙනහිරට මු.පි.නු. 2308 හි කැබලි අංක 33 ද, දකුණට මු.පි.නු. 2308 හි කැබලි අංක 33 සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, සහ බටහිරට මු.පි.නු. 2308 හි කැබලි අංක 33 සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයද, යන මායිම් තුල පිහිටි හෙක්ටයාර බිංදුවයි දශම හතරයි අටයි අටයි අටක (හෙක්ටයාර 0.4888) ප්‍රමාණයකින් සමන්විත වූ බිම් කැබැල්ල වේ.";

*(ආ)* එහි 6 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"6. ගුවන්සේවා කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු නිකේතනය ඉදිකර තිබෙන නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිදුරුතලාගල පිහිටි ඉඩම එහි ඇති හෝ ඊට ආබද්ධ කවර හෝ ඉදිකිරීම් ආදිය ද සමඟ, එනම් -

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 535F හාවාඑළිය බටහිර ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල්වරයා විසින් සාදන ලද අංක 330184 දරන සහ

2024.11.27 වන දිනැති කැඩැස්තර සිතියම මගින් බෙදා වෙන් කළ කලාප අංක 02 හි කැබලි අංක 01 ලෙස නිරූපිත උතුරට මු.පි.නු. 2289 හි කැබලි අංක 23 සහ අංක 330184 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 02 හි කැබලි අංක 02 ද, නැගෙනහිරට අංක 330184 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 02හි කැබලි අංක 02 ද, දකුණට පේන්ටර් හෝම් ගොවිපළ ද, සහ බටහිරට පේන්ටර් හෝම් ගොවිපළ සහ මු.පි.නු. 2289 හි කැබලි අංක 23 ද, යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම පහයි අටයි එකයි හතරක් (හෙක්ටයාර් 0.5814) ප්‍රමාණයකින් සමන්විත වූ බිම් කැබැල්ල වේ.”.

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ
සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2025 අගෝස්තු මස 25 දින,
කොළඹ දී ය.

EOG 08 - 0282